00026

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා)උපාධි වැඩසටහන-පස්වන මට්ටම 2017/2018

අවසාන පරීක්ෂණය - 2018

අධ්‍යාපනයේ උපදේශනය හා මාර්ගෝපදේශය - ESU3128

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2018.02.02 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. පුද්ගල ජීවිතයට මාර්ගෝපදේශයේ අවශ්‍යතාවය උදාහරණ තුනක් (03) ආශ්‍රයෙන් පෙන්වා දෙන්න.

02. උපදේශනය අවශ්‍ය වන සුවිශේෂී ගැටලු පහක් (05) ලැයිස්තු ගත කරන්න.

03. විමධ්‍යගත උපදේශන හා මාර්ගෝපදේශ සංවිධාන ව්‍යුහයේ වාසි තුනක් (03) පැහැදිලි කරන්න.

04. උපදේශනයේ න්‍යායාත්මක ප්‍රවේශ පහ (05) ලැයිස්තුගත කරන්න.

05. වෘත්තීය උපදේශනයේ හා මාර්ගෝපදේශයේ අරමුණු තුනක් (03) ලැයිස්තුගත කරන්න.

06. ළමයින්ගේ අධ්‍යාපනික සංවර්ධනය සඳහා සමායෝගීවීමේ ගැටලු කොතෙක් දුරට බලපාන්නේ ද?

07. විශේෂ අධ්‍යාපනික අවශ්‍යතා සහිත ළමයින්ට උපදේශනය අවශ්‍ය බව පෙන්වීමට කරුණු තුනක් (03) දක්වන්න.

08. තම සමායෝගී බව සුරකෙන අයුරින් ජනමාධ්‍ය මනා ලෙස භාවිත කිරීම සම්බන්ධයෙන් ඔබ ළමයින්ට උපදෙස් දෙන්නේ කෙසේ ද?

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. පාසල් විෂයමාලාව තුළ වර්ධනය වන සංකීර්ණතා හමුවේ ශ්‍රී ලාංකේය අධ්‍යාපන පද්ධතිය තුළ සිටින බොහෝ සිසුන් විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙයි.

i. ළමයින් මුහුණ දෙන පාසල් විෂය මාලාව ආශ්‍රිත එවැනි ගැටළු තුනක් (03) පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. උක්ත ගැටළු අතරින් ගැටළු දෙකක් (02) තෝරාගෙන ළමයින්ගේ සංවර්ධනය කෙරෙහි ඒවායෙහි බලපෑම පරීක්ෂා කරන්න. (ලකුණු 10)

10. i. පාසල්වල ඵලදායී උපදේශන හා මාර්ගෝපදේශන සේවයක් ස්ථාපිත කිරීමෙහි ලා පවතින, පාසල් ප්‍රජාව ආශ්‍රිත ගැටලු තුනක්(03) සඳහන්කොට ඒවා සැකෙවින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. ඉහත දක්වන ලද ගැටලු මඟහරවා ගනිමින් ඵලදායී උපදේශන හා මාර්ගෝපදේශ සේවයක් නිර්මාණය කරලීමට ඔබ ගන්නා ක්‍රියාමාර්ග මොනවා ද? (ලකුණු 10)

11. i. ඔබගේ පාසල තුළ උපදේශන හා මාර්ගෝපදේශ සේවයක් ස්ථාපිත කිරීමේදී ඔබ සලකා බලන ප්‍රධාන කරුණු තුනක් (03) සඳහන් කොට එම කරුණු සලකා බැලීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. පාසල් උපදේශන හා මාර්ගෝපදේශ සේවයක් සඳහා ඔබ ඉහත සඳහන් කළ කරුණු නොසැළකීමෙන් ඉස්මතු විය හැකි ගැටලු දෙකක් (02) සඳහන් කොට, එම ගැටලු මඟහරවා ගැනීම සඳහා යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

12. i. ළමයින් අධ්‍යයනය කිරීමට භාවිත කළ හැකි පරීක්ෂණ ගණයේ නොවන උපදේශන ශිල්ප ක්‍රම තුනක් (03)කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. ඔබ ඉහත දක්වන ලද ශිල්ප ක්‍රම අතුරින් වඩාත්ම ඵලදායී උපදේශන ශිල්ප ක්‍රමය තෝරාගෙන, ඔබගේ එම තෝරා ගැනීමට හේතු පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. i. ළමයින්ගෙන් විද්‍යාමාන විය හැකි විනාශකාරී චර්යාවන්හි ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. ළමයින්ගේ විනාශකාරී චර්යා සඳහා බලපෑ හැකි පවුල ආශ්‍රිත ගැටළු මොනවා ද? (ලකුණු 10)

14. i. ළමයින් තුළ ඉගෙනුම් දුෂ්කරතා ඇති වීමට පාසල ආශ්‍රිත සාධක බලපාන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. ළමයින් තුළ ඉගෙනුම් දුෂ්කරතා තත්ත්ව අවම කිරීමට පාසල් මට්ටමින් ඔබට ගත හැකි ක්‍රියාමාර්ග යෝජනා කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.